- **ආදරණීය දුවේ පුතේ,**
- **පහත වාක්‍ය හොඳින් කියවන්න.**

වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය වෙන් කර ලියන්න.
අශ්වයා වේගයෙන් දුවයි.
එළදෙන පැටියාට කිරි දුන්නා ය.
අරිත දිනපතා පාසල් ගියේ ය.
ගොවියා උදෑසනින් ම කුඹුරට යයි.
උතුළ ප්‍රියවචන කතා කරයි.
දේශකයා හරවත් දේශනයක් පවත්වයි.
රජතුමා සාධාරණ ව නඩු විසඳුවේ ය.
කිවිඳිය කවි පොතක් එළිදැක්වූවා ය.
ශිෂ්‍යයා තරගයට සහභාගි වෙයි.
මුවා දිය බොයි.

- **අතීතකාල හා වර්තමාන කාල වාක්‍ය වෙන් කර ලියන්න.**

වර්තමාන කාල වාක්‍ය	අතීත කාල වාක්‍ය

ඡේදය හොඳින් කියවන්න.
හිරු උදා විය. දවස ආරම්භ විය. සිතුම් චිත්‍රයක් අඳියි. විහඟ කතන්දර පොතක් කියවයි. "මගේ හොඳ ළමයි. උදෙන් ම නැඟිටලා වැඩ පටන් අරගෙන" සීයා අප දෙස බලා පැවසුවේ ය. "තාත්තේ, අද මල්ලී එනවා කිවුවා නේ ද?" යැයි තාත්තා සීයාගෙන් ඇසුවේ ය. "ආ . . . ඔව්. මට ඒක අමතක වුණා නේ. එහෙනම් ඉතින් අපේ පුංචි පැටවු දෙන්නා පුංචි අම්මා එක්ක හොඳට සෙල්ලම් කරයි." යනුවෙන් පැවසූ සීයා වතුර වීදුරුවක් බිවුවේ ය. සීයා උදෑසනින් ම අවදි වී වතුර වීදුරුවක් බොයි. එය සීයාගේ හොඳ පුරුද්දක් බව අම්මා අපට පවසයි. " එහෙනම් අද විශේෂ කෑමක් හදමු" යැයි අම්මා තාත්තාට යෝජනා කළා ය. "අපි උදේට ඉඹුල් කිරිබත් හදමු" යැයි තාත්තා රස කරමින් කිවුවේ ය. "ඒක හොඳයි. නංගි ඉඹුල් කිරිබත්වලට ගොඩක් කැමති යි" යැයි කියමින් අම්මා කුස්සියට ගියා ය. අම්මා සාදන ඉඹුල් කිරිබත් කෑමට විහඟ මල්ලී බොහෝ සේ ප්‍රිය කරයි. පුංචි අම්මා සහ බාප්පා එන තුරු අප සිටියේ නොඉවසිල්ලෙනි.

- අතීත හා වර්තමාන කාල වෙන් කර ලියන්න

වර්තමාන කාල වාක්‍ය	අතීත කාල වාක්‍ය